# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2380/17 – 2024 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා – 2024.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ අංක ඊ 413 ඩී පෙනලබොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පෙනලබොඩ (අ.ග.පි.263 තුළ ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ma/NUL/2021/200 සහ 2022.03.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.7607 ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර "A" - කඩිගලමූකලාන - ප්‍රමාණයඃ හෙක්. 1.4851.**

උතුරට: රජය හිමිකම් කියන කඩිගලමූකලාන; නැගෙනහිරට: රජය හිමිකම් කියනකඩිගලමූකලාන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට : කැබලි අක්ෂර B සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: රජය හිමිකම් කියන කඩිගලමූකලාන.

**02. කැබලි අක්ෂර "B" - සඳහන් නොවේ - ප්‍රමාණයඃ හෙක්.0.0072**

උතුරට: කැබලි අක්ෂර A සහ රජය හිමිකම් කියන කඩිගලමූකලාන; නැගෙනහිරට : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ රජය හිමිකම් කියන කඩිගලමූකලාන; දකුණට : කැබලි අක්ෂර C සහ රජය හිමිකම් කියන කඩිගලමූකලාන; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ රජය හිමිකම් කියන කඩිගලමූකලාන.

**03. කැබලි අක්ෂර "C" - කඩිගලමූකලාන - ප්‍රමාණයඃ හෙක්.0.2684.**

උතුරට: කැබලි අක්ෂර B සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: රජය හිමිකම් කියන කඩිගලමූකලාන; දකුණට: රජය හිමිකම් කියන කඩිගලමූකලාන; බටහිරට: රජය හිමිකම් කියන කඩිගලමූකලාන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2020/MV/288-I.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2024 මාර්තු මස 20 වැනි දින.

EOG 04 - 0143